ආයතනයේ නම : මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 184

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

நிறுவனத்தின் பெயர் : நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 184

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119 (4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

Name of the Institution : Ministry of Finance, Economic Stabilization and National Policies

Parliamentary Series : 184

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

ආයතනයේ නම	:	මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක	:	184

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 184

රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව

<u>පටුන</u>

අනු අංකය	මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තුව	පිටු අංකය
1.	වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව	1
2.	ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව	59

දෙපාර්තමේන්තුවේ නම : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 184

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

	වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
1.	සිනිබදු අඩු කිරීමෙන් රජයට ලැබිය යුතුව තිබූ ආදායම් අහිමිවීම සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශව හඳුනා ගැනීම සහ මෙම බදු අඩුකිරීමෙන් අයථා ලෙස බදු වාසි අත්පත් කරගත් පාර්ශවයන්ගෙන් එම මුදල් නැවත රජයට අයකර ගැනීම සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පූර්ණ විමර්ශණයක් සිදුකිරීම.	මෙම කරුණ පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පූර්ණ විමර්ශනයක් සිදුකිරීම සඳහා 2022.07.12 දිනයෙන් පොලිස්පතිතුමාගෙන් ඉල්ලීම් කරන ලද අතර, ඒ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය හා වාණිජ අපරාධ විමර්ශන කොට්ඨාසය වෙත 2022.07.21 දින අවශ්‍ය ප්‍රකාශයන් ලබාදී ඇත **(ඇමුණුම 1)**. එමෙන්ම, මෙම පරීක්ෂණයේ ප්‍රගතිය පිළිබඳව විමසීමක් 2023.03.02 දිනයෙන් පොලිස්පතිතුමා වෙත යොමුකර ඇත **(ඇමුණුම 2)**.
2.	බදු සංශෝධනය හා මිල පාලනය සම්බන්ධ තීරණ ගැනීම සඳහා අදාළ සියලුම ආයතන ඇතුළත් වන පරිදි විධිමත් කමිටුවක් ස්ථාපිත කිරීම.	මේ සඳහා වර්ෂ 2015-2019 කාලය තුළදී ජීවන වියදම පිළිබඳව අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවක් ස්ථාපිත කර තිබූ අතර, 2020 වර්ෂයේ සිට එවකට ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුත් වෙළඳ හා රේගුව පදනම් කරගත් බදුකරණ ප්‍රතිපත්ති කමිටුව අවශ්‍ය තීරණ ගන්නා ලදී. වර්තමානයේ ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් යුතු ආහාර **ප්‍රතිපත්ති කමිටුව** ස්ථාපිත කර ඇත(අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 22/1495/601/014 සහ 2022.10.03 දිනැති තීරණය) . ඒ අනුව, එම කමිටුව 2022.10.03 දින සිට වරින් වර රැස්වන ලද අතර, එම කමිටුවේ තීරණ මත, මේ වන විට අත්‍යාවශ්‍ය ආහාර භාණ්ඩ සඳහා බදු සංශෝධනයන් සිදු කරනු ලබයි **(ඇමුණුම 3)**. මෙම කමිටුවේ සභාපති ලෙස ජනාධිපති ලේකම්තුමා කටයුතු කරන අතර, එහි සාමාජිකයින් ලෙස, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය, ධීවර, ප්‍රවාහන හා මහමාර්ග, කෘෂිකර්ම , වැවිලි කර්මාන්ත, වෙළඳ හා ආහාර සුරක්ෂිතතා සහ විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශ ලේකම්වරු කටයුතු කරයි.
3.	භාණ්ඩයක බදු හා මිල තීරණය කිරීමේදී සලකා බැලිය යුතු තොරතුරු හා දත්ත පහසුවෙන් ලබාගැනීම සඳහා නිසි යාන්ත්‍රණයක් සකස් කිරීම .	භාණ්ඩ ආනයන හා අපනයන දත්ත ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යන අතර, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව නිල වශයෙන් වෙළඳපල දත්ත/ දේශීය

		නිෂ්පාදනය පිළිබඳ සංඛ්‍යාලේඛන පවත්වාගෙන යනු ලැබේ. එම දත්ත, ශ්‍රී ලංකා රේගුවේ ASYCUDA දත්ත පද්ධතිය මඟින් මුදල් අමාත්‍යාංශයට, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවට සහ පාරිභෝගික කටයුතු අධිකාරිය වැනි ආයතන වලට මාර්ගගත ක්‍රමය මඟින් (on line basis) ලබාගැනීමට හැකියාව ඇත. අනෙකුත් විශේෂ ක්ෂෙත්‍රයකට අදාළ දත්ත අදාළ ආයතන මඟින් සෘජුව ලබාගැනීමට කටයුතු කරනු ඇත.
4.	විගණකාධිපතිවරයාගේ වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණ හා නිර්දේශ සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම	විගණකාධිපතිවරයාගේ වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණ හා නිර්දේශ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ විෂය පථය යටතේ ගැනෙන කරුණු පිළිබඳ වාර්තාවක් 2022.04.25 දිනයෙන් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත **(ඇමුණුම 4).** වෙළඳ අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විෂය පථය යටතේ ගැනෙන කරුණු සම්බන්ධයෙන් වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස 2023.01.16 දිනයෙන් ලේකම්, වෙළඳ අමාත්‍යාංශය දැනුවත් කිරීමට කටයුතු කර ඇත **(ඇමුණුම 5).**
5.	සී/ස ලංකා සතොස ආයතනය මඟින් විවෘත වෙළඳ පොළෙන් වැඩි මිලට භාණ්ඩ මිලදී ගෙන පාලන මිලට අලෙවි කිරීම තුළින් සිදුවන අලාභය අවම කර ගැනීම සඳහා සී/ස ලංකා සතොස මඟින් අත්‍යාවශ්‍ය භාණ්ඩ සෘජුව ආනයනය කිරීමේ හැකියාව සොයාබැලීම	මෙම කරුණ වෙළඳ අමාත්‍යාංශයේ විෂය පථයේ කටයුතු කළ යුතු කාර්යයකි. වෙළඳ අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විෂය පථය යටතේ ගැනෙන කරුණු සම්බන්ධයෙන් වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස 2023.01.16 දිනයෙන් ලේකම්, වෙළඳ අමාත්‍යාංශය දැනුවත් කිරීමට කටයුතු කර ඇත **(ඇමුණුම 5).**
6.	බලපත්‍ර නොමැතිව ආනයනය කරනු ලබන භාණ්ඩ සඳහා අය කළ යුතු 5% ක අතිරේක ගාස්තුව සිය අභිමතය පරිදි 2% දක්වා අඩු කිරීමෙන් රජයට අහිමිවූ ආදායම හා එවැනි ක්‍රියාමාර්ගයක් ගැනීමට හේතු ඇතුළත් වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම	සීනි සඳහා ආනයන බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය පිලිබඳව ආනයන හා අපනයන පාලක ජනරාල් වෙත 2022.08.19 දිනැති ලිපිය මඟින් අවධානයට යොමුකර ඇති අතර, මේ සම්බන්ධයෙන් ආනයන හා අපනයන පාලක ජනරාල්ගේ 2022.11.23 දිනැති ලිපිය මඟින් පිළිතුරු ලබාදී ඇත **(ඇමුණුම 6).** එම ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් එවා ඇති වාර්තාව 2023.03.02 දිනයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ ලේකම් වෙත යොමු කර ඇත(**ඇමුණුම 7**).
7.	විගණකාධිපතිවරයාගේ වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණ හා නිර්දේශ අදාළ ආයතන මඟින් ක්‍රියාත්මක කොට එහි ප්‍රගතිය මාස 3 ක කාලයකින් කාරක සභාව හමුවට ඉදිරිපත් කිරීම	රජය කැපකළ බදු ආදායම නැවත අයකර ගැනීමට ඇති හැකියාව පිළිබඳව නීතිපති උපදෙස් ලබාගැනීමට 2022.07.11 දිනයෙන් කටයුතු කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවට අවශ්‍ය වාචික පැහැදිලි කිරීම් 2022.07.21 දිනයෙන් ලබාදී ඇත **(ඇමුණුම 8).** නීතිපති දෙපාර්තමේන්තුවේ ලිඛිත උපදෙස්

		ලබාදෙන ලෙස සිහිකැඳවීමේ ලිපියක් 2023.03.02 දිනයෙන් නීතිපති තුමා වෙත යොමුකර ඇත(ඇමුණුම 9).

කාරක සභාවේ නිර්දේශ

	වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු	ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා හා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය
1.	බදු සංශෝධනයකදී අදාළ ආයතන අතර මනා සම්බන්ධතාවයක් තිබිය යුතු බව	ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් යුතු ආහාර ප්‍රතිපත්ති කමිටුව 2022.10.03 දින සිට වරින් වර රැස්වන ලද අතර, එම කමිටුවේ තීරණ මත මේ වන විට අත්‍යාවශ්‍ය ආහාර භාණ්ඩ සඳහා බදු සංශෝධනයන් සිදු කරන අතර, ඒ සඳහා අදාළ සියළු පාර්ශවයන්/ ආයතන සම්බන්ධ වේ.
2.	පාලන මිලක් නියම කිරීමේදි වෙළඳපොළ පිළිබඳව හොඳින් අධ්‍යයනය කර එය සිදු කළ යුතු බව	පාලන මිල නියම කිරීම වෙළඳ අමාත්‍යාංශය යටතේ පාරිභෝගික කටයුතු අධිකාරිය මගින්, 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු අධිකාරි පනත මගින් ලැබී ඇති බලතල යටතේ ක්‍රියාත්මක කරනු ලබයි.
3.	පාලන මිල ක්‍රියාත්මක කිරීම සඳහා නිසි යාන්ත්‍රණයක් සකස් කළ යුතු බව	
6.	බදු අඩු කිරීමේ වාසිය ජනතාවට නිසියාකාරව විතැන් නොවූ බැවින් එම බදු වාසිය තම අත රඳවාගත් පාර්ශවයන්ගෙන් නැවත රජයට අයකර ගැනීමේ හැකියාව පිළිබඳව නීති උපදෙස් ලබාගැනීම ප්‍රමාදවී ඇති බැවින් ඒ සඳහා කඩිනමින් අවශ්‍ය කටයුතු කළයුතු බව	රජය කැපකළ බදු ආදායම නැවත අයකර ගැනීමට ඇති හැකියාව පිළිබඳව නීතිපති උපදෙස් ලබාගැනීමට 2022.07.11 දිනයෙන් කටයුතු කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවට අවශ්‍ය වාචික පැහැදිලි කිරීම් 2022.07.21 දිනයෙන් ලබාදී ඇත. නීතිපති දෙපාර්තමේන්තුවේ ලිඛිත උපදෙස් ලබාදෙන ලෙස සිහිකැඳවීමේ ලිපියක් 2023.03.02 දිනයෙන් නීතිපති තුමා වෙත යොමුකර ඇත.
7.	ජනාධිපතිවරයාගෙන් වූවද නියෝගයක් ලද විට එම නියෝගය ක්‍රියාත්මක කිරීමෙන් පසු ඇතිවිය හැකි බලපෑම පිළිබඳව සමාලෝචනය කොට එහි යහපත්/ අයහපත් ප්‍රතිපල පිළිබඳ අදාළ බලධාරීන් දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් සැකසිය යුතු බව	බදු සංශෝධනය සිදුකළ යුතු භාණ්ඩ නම්කර, සංශෝධනය සිදුකල යුතු බදු අනුප්‍රමාණයන් ද දක්වා ක්‍රියාත්මක කළයුතු කාලයද (ඉතා ඉක්මනින්) දක්වා අවසන් තීරණය ගෙන දෙනු ලබන නියෝගයන් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයාගේද එකඟවීම මත (අදාළ පනත් මගින් ඇමතිවරයාට නියෝග නිකුත් කිරීමේ බලය ඇති බැවින්) ක්‍රියාත්මක කළ යුතු වන අවස්ථා ඇත. එහෙත් ජනාධිපතිවරයාගෙන් වූවද, බදු සංශෝධනයක් සිදුකිරීම අධ්‍යනයකර අදාළ ක්‍රියාමාර්ග ගැනීමට නියෝගයක් ලැබුවිට ඒ අනුව අදාළ පාර්ශව සමඟ අධ්‍යනය කර අවශ්‍ය කටයුතු ඉටුකිරීම සාමාන්‍ය ක්‍රමවේදය වේ. රටේ ඇතිවී ඇති හදිසි තත්ත්වයක් මත විධායක ජනාධිපතිවරයා හෝ අමාත්‍ය මණ්ඩලය ගත් අවසන් තීන්දුවක්, නියෝගයක් වශයෙන් ලද විට හෝ

		විෂයභාර අමාත්‍යාවරයකුගේ ඉල්ලීමක් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාවරයාගේ එකඟවීමක් ඇතිනම් සහ අදාළ නියෝගය ක්‍රියාත්මක කිරීමට ඇති කාලයද නිශ්චිතව දක්වා ඇත්නම්, අදාළ පනත් මගින් මුදල් අමාත්‍යාවරයාට අවසන් අනුමැතිය හිමිවන බැවින්, ඒ අනුව කටයුතු කිරීමට සිදුවේ. කෙසේ වුවද, අමාත්‍යාවරයාට අදාළ පනත මගින් හිමිවන නීතිමය බලය යටතේ නිකුත් කරනු ලබන බදු සංශෝධන ගැසට් නිවේදනයන් අවසාන වශයෙන් පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කර සම්මත කර ගැනීම සිදු කරනු ලබයි.
8.	තීරු බදු නිර්ණය කිරීමේ කමිටුව (Tariff Determination Committee) නීත්‍යානුකූල කිරීමට කටයුතු කිරීම	හිටපු ජනාධිපතිතුමා විසින් පත්කර තිබූ මෙම කමිටුව, මේ වන විට ක්‍රියාත්මකව නොමැත.
9.	ජීවන වියදම් කමිටුව යළි සක්‍රීය කිරීම	ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් යුතු ආහාර ප්‍රතිපත්ති කමිටුව 2022.10.03 දින සිට ක්‍රියාත්මකව පවතී
10.	දැනට බලපැවැත්වෙන පාරිභෝගික සේවා අධිකාරි පනතෙහි ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන්නේ නම් වර්තමානයට ගැලපෙන ආකාරයට පනත සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු බව	වෙළඳ අමාත්‍යාංශය සහ පාරිභෝගික කටයුතු අධිකාරිය මගින් සිදුකළ යුතුය
11.	භාණ්ඩයක් සඳහා බදු නිර්ණය කිරීමේදී මෙන්ම මිල නිරණය කිරීමේ දී රටතුළ පවතින භාණ්ඩ තොග ප්‍රමාණය , බන්ධිත ගුදම්වල පවතින ප්‍රමාණය ආදී තොරතුරු සමාලෝචනය කළ යුතු බව හා ඊට අදාළ දත්ත රැස්කර තබාගැනීම සඳහා නිසි යාන්ත්‍රණයක් සකස්කළ යුතු බව.	රේගු ආඥා පනත 14 වන වගන්තිය යටතේ පවතින නීතිරීති වලට යටත්ව, වෙළඳාම පහසුකරලීම සඳහා (Trade Facilitation) ලබාදී ඇති පහසුකමක් ලෙස බන්ධිත ගුදම් පහසුකම් සැලකේ. ඒ අනුව සීනි සඳහා බන්ධිත ගුදම් පහසුකම පුද්ගලික ව්‍යාපාරික ආයතන 02 ක් විසින් ලබාගෙන ඇත. මෙම බන්ධිත ගුදම් පහසුකම යටතේ ආනයනකරුවකුට අන්තර් ජාතික මිළ වෙනස්වීම මත (අඩු අවස්ථා වලදී) විශාල තොගයක් එකවර රැගෙන තොග ප්‍රවාහන පිරිවැය අවමකර ගැනීම වැනි වාසි ලබාගැනීමටත්, එය ගුදම්න් ඉවත්කර ගන්නා අවස්ථාවේ පවතින බද්ද ගෙවීමට ද යටත් වේ. බන්ධිත ගුදම් මගින් භාණ්ඩ නිදහස් කරගැනීමද භාණ්ඩ ආනයනයක් හා සමානව සැලකීම රේගු ආඥා පනතේ යටතේ සිදු කෙරේ. එමෙන්ම, බන්ධිත ගුදම් වල ඇති භාණ්ඩ නැවත ප්‍රතිඅපනයන කටයුතු සඳහා තාවකාලිකව රදවාගත් භාණ්ඩ වියහැකි බැවින් එකී ගුදම් වල ඇති භාණ්ඩ රටතුළ ඇති භාණ්ඩ සේ සැලකිය නොහැක. යම් භාණ්ඩයක් රටතුළට ගෙන ඒමේදී අදාළ තොග ප්‍රමාණ , වටිනාකම් ඇතුළු සියළු දත්ත රේගු දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතියට ඇතුලත් කරනු ලබන අතර, එමගින් රට තුළට ගෙනවිත් ඇති තොග ප්‍රමාණය සහ ආනයනකරුවන් කවුරුන්ද යන්න තහවුරු කරගත හැකිය. එහෙත්

		තොග අලෙවිකරුන්ගේ සිට සිල්ලර සහ පාරිභෝගිකයන් අතැති තොග පිළිබඳ දත්ත රැස්කර තබා ගැනීම, බදු සංශෝධනයක් සිදුකිරීමට පෙර සලකා බැලීම අදාළ බදු සංශෝධනය බලාත්මක කළ යුතු කාලරාමුව අනුව තීරණය වන අතර, හදිසි බදු සංශෝධනයකදී බීම මට්ටමේ දත්ත සලකා බැලීම ප්‍රායෝගිකව සිදුකළ නොහැකිවනු ඇත. කෙසේ වුවද, රේගු දත්ත අනුව සහ පාරිභෝගික කටයුතු අධිකාරිය වැනි ආයතනවල දත්ත ඇසුරින් සාමාන්‍ය මාසික හෝ වාර්ෂික පාරිභෝජනය මත පදනම්ව උපකල්පිත තොග අගයන් සැලකිල්ලට ගතහැක.
14.	විගණකාධිපතිවරයාගේ වාර්ථාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇති ආයතන විසින් ඒ සඳහා සුදුසු වැඩ පිළිවෙළක් සකස් කර එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම හා එහි ප්‍රගතිය කාරක සභාවට දැනුම්දීම .	අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණය සහ නීතිපති උපදෙස් ලැබීම අනුව මුදල් විෂය භාර අමාත්‍යාංශය යටතේ ඉටුකළ යුතු නිර්දේශ සම්බන්ධයෙන් කටයුතු කරනු ඇත. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් සිදුකරන පරීක්ෂණයේ ප්‍රගතිය පිලිබඳව විමසීමක් 2023.03.02 දිනයෙන් පොලිස්පතිතුමා වෙත යොමුකර ඇති අතර නීතිපති දෙපාර්තමේන්තුවේ ලිඛිත උපදෙස් ලබාදෙන ලෙස සිහිකැඳවීමේ ලිපියක් 2023.03.02 දිනයෙන් නීතිපති තුමා වෙත යොමුකර ඇත.
15.	මහා පරිමාණ ආනයනකරුවන් සහ තොග වෙළඳුන් පරීක්ෂා නොකොට කුඩා සිල්ලර වෙළෙඳුන් පමණක් පරීක්ෂා කිරීම තුළින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සිය වගකීම නිසි ලෙස ඉටුකර නොමැති බව.	වෙළඳ අමාත්‍යාංශය සහ පාරිභෝගික කටයුතු අධිකාරිය මගින් පිළිතුරු දිය යුතුය.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 184 සඳහා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු භාෂාත්‍රයෙන් ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

කේ. ඒ. විමලේන්ද්‍රරාජා
අධ්‍යක්ෂ ජනරාල්
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

ඇමුණුම 1

A + 3

රහස්‍යයි

තැ.පො.අංකය
த. பெ. இல
P.O.Box.No

විද්‍යුත් ලිපිනය
மின்னஞ்சல்
E-Mail
Dir.f&ccid@police.gov.lk

ෆැක්ස් අංකය
பெக்ஸ் இல
Fax NO.

මාගේ අංකය
எனது இல
My No

ඔබේ අංකය
உங்கள் இல
Your No

දිනය
திகதி
Date
2022.07.20

ශ්‍රී ලංකා පොලිසිය
இலங்கை பொலிஸ்
SRI LANKA POLICE
මූල්‍ය හා වාණිජ අපරාධ විමර්ශන කොට්ඨාසය
අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව
நிதி மற்றும் வணிக குற்ற விசாரணைப் பிரிவு
குற்றப் புலனாய்வு திணைக்களம்
FINANCIAL & COMMERCIAL CRIME INVESTIGATION DIVISION
Criminal Investigation Department
03 මහල, නව මහලේකම් ගොඩනැගිල්ල, කොළඹ 01.
03 ஆம் மாடி, புதிய செயலகக் கட்டிடத் தொகுதி, கொழும்பு – 01
03rd Floor, New Secretariat Building, Colombo – 01

20 JUL 2022
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

04/TIP
20/07/2022

ලේකම්,
මුදල් ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය,
මහලේකම් කාර්යාලය,
කොළඹ 01.

මහත්මයාණනි,

<u>රජයේ ගිණුම පිළිබඳ කාරක සභාවේ නියමය පරිදි සීනි ආනයන බදු සංශෝධනය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පූර්ණ විමර්ශණයක් සිදු කිරීම.</u>

උක්ත කාරණය යටතේ ඔබතුමා විසින් පොලිස්පති තුමා වෙත 2022.07.12 දිනැති TIP/TP/01/10 (T 4) VOL 1 දරණ ලිපිය හා බැඳේ.

ඒ අනුව ශීර්ෂගත කාරණය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය හා වාණිජ අපරාධ විමර්ශන කොට්ඨාසයේ ප්‍රධාන පොලිස් පරීක්ෂක ජේ.එම්.එම්.ජයසුන්දර මහතා ඇතුළු නිලධාරීන් කණ්ඩායමක් යොදවා විමර්ශන ආරම්භ කර ඇත.

ඒ අනුව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත 2022.06.21 දින ඉදිරිපත් කරන ලද " සීනි සඳහා පනවා තිබූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අඩු කිරීම නිසා රජයට ලැබිය යුතුව තිබූ බදු ආදායම් නොලැබී යාම හා ඒ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගැනීම යන කරුණු තහවුරු කෙරෙන සියළු ලේඛන මෙම විමර්ශන කොට්ඨාසය මගින් සිදු කරනු ලබන පරීක්ෂණය සඳහා භාර ගනිමින් ඊට අදාළව ඔබගේ සවිස්තර ප්‍රකාශයක් සටහන් කල යුතුව ඇත.

එබැවින් මෙම කාරණය හා සම්බන්ධ සියළු ලිපි ලේඛනද රැගෙන 2022.07.21 දින පැය 1000 ට කොළඹ 01 නව මහලේකම් ගොඩනැගිල්ලේ දෙවන මහලේ පිහිටුවා ඇති මූල්‍ය අපරාධ විමර්ශන ඒකක 01 හි ස්ථානාධිපති වරයා හමුවන මෙන් 1978 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 109(6) වගන්තිය ප්‍රකාරව මෙයින් කාරුණිකව දන්වා සිටිමි.

දිනය - 2022/07/20

සහකාර පොලිස් අධිකාරී
මූල්‍ය හා වාණිජ අපරාධ විමර්ශන කොට්ඨාසය
සහකාර පොලිස් අධිකාරී

(3)

TIP/TP/01/10(T 4) Vol 1

2022.07. 12

පොලිස්පති
ශ්‍රී ලංකා පොලීසිය
පොලිස් මූලස්ථානය -කොළඹ

පොලිස්පතිතුමනි

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නියමය පරිදි සීනි ආනයන බදු සංශෝධනය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පූර්ණ විමර්ශණයක් සිදු කිරීම

රජයේ ගිණුම් කාරක සභා ලේකම් විසින් යොමුකර ඇති අංක රා.ගි.කා.ස /9/2022 සහ 2022 ජූනි 28 දිනැති ලිපිය හා බැඳේ **(ඇමුණුම 1)**.

02. ඒ අනුව, සීනි කිලෝ ග්‍රෑම් එකක් සඳහා පනවා තිබුණු විශේෂ වෙළඳ භාණ්ඩ බදු රු. 50 සිට ශත 25 දක්වා අඩු කිරීමෙන් බලාපොරොත්තු වූ සහනය පාරිභෝගික ජනතාවට ලැබීම පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා වූ විශේෂ විගණන වාර්තාව සම්බන්ධයෙන් 2022.06.21 දින පවත්වන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේ කාර්ය සටහන 1 හි නියෝගය පරිදි, සීනි සඳහා පනවා තිබූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අඩු කිරීම නිසා රජයට ලැබිය යුතුව තිබූ බදු ආදායම නොලැබී යාම හා ඒ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගැනීම සහ අහිමි වූ බදු මුදල් නැවත අයකර ගැනීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පූර්ණ විමර්ශණයක් සිදුකරන ලෙස රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් නියෝග කර ඇති අතර, ඒ අනුව එම විමර්ශණය සිදුකරන ලෙස ඉල්ලීමක් කිරීමට මා වෙනද නියෝග කර ඇත.

03. මේ සම්බන්ධයෙන් අවශ්‍ය විමර්ශන කටයුතු ඉතා ඉක්මනින් සිදුකර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

කේ. එම්. එම්. සිරිවර්ධන
ලේකම්
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

O/C

ඇමුණුම 2

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No: TIP/TP/01/10(T 4) Vol 2
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2023.03. 02

පොලිස්පති
ශ්‍රී ලංකා පොලිසිය
පොලිස් මූලස්ථානය -කොළඹ

පොලිස්පතිතුමනි

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නියමය පරිදි ඕනි ආනයන බදු සංශෝධනය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පූර්ණ විමර්ශණයක් සිදු කිරීම

ඉහත කරුණු සම්බන්ධයෙන් ඔබවෙත යොමුකරන ලද මාගේ අංක TIP/TP/01/10(T4) Vol 1 සහ 2022.07.12 දිනැති ලිපිය හා බැඳේ (පිටපතක් අමුණා ඇත).

ඒ අනුව, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නියෝගය පරිදි, ආරම්භ කර ඇති විමර්ශණයේ වර්තමාන තත්ත්වය පිළිබඳව මා වෙත වාර්ථා කරන්නේ නම්, එම ප්‍රගතිය පිළිබඳව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව (රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව) දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු කල හැකිබව ඔබ වෙත කාරුණිකව දන්වා සිටිමි.

කේ. එම්. එම්. සිරිවර්ධන
ලේකම්
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

පිටපත්:
1. ලේකම්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
2. සහකාර පොලිස් අධිකාරී, මූල්‍ය හා වාණිජ අපරාධ විමර්ශන කොට්ඨාසය, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව
3. ප්‍රධාන මූල්‍ය නිලධාරී, මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

ඇමුණුම 3

රහසිගතයි

අමාත්‍ය මණ්ඩල කාර්යාලය
அமைச்சரவை அலுவலகம்
OFFICE OF THE CABINET OF MINISTERS

CABINET DECISION | අමාත්‍ය මණ්ඩල තීරණය | அமைச்சரவைத் தீர்மானம்

මගේ අංකය: අමප/22/1495/601/014 2022 ඔක්තෝබර් මස 11 දින.

පිටපත්:

අග්‍රාමාත්‍ය ලේකම්.
අමාත්‍ය මණ්ඩලයේ අනෙකුත්
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්.
විගණකාධිපති.

ක්‍රියා කළ යුතු:

ජනාධිපති ලේකම්.
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්.
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්.
ධීවර අමාත්‍යාංශයේ ලේකම්.
ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්.
කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්.
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්.
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්.
වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ලේකම්.
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති.
ආහාර කොමසාරිස්.
සමුපකාර සංවර්ධන කොමසාරිස්.
අධ්‍යක්ෂ ජනරාල්, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය.
ප්‍රධාන විධායක නිලධාරි, සීමාසහිත ලංකා සතොස සමාගම.
සාමාන්‍යාධිකාරි, වී අලෙවි මණ්ඩලය.

For Office Use Only

'ආහාර ප්‍රතිපත්ති කමිටුව' ස්ථාපිත කිරීම

(ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ 2022-09-23 දිනැති සංදේශය)

2022 ඔක්තෝබර් මස 03 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹී තීරණයක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.ඩී.ජේ.ප්‍රනාන්දු
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

→ 2

06. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 22/1495/601/014 වූ, **"ආහාර ප්‍රතිපත්ති කමිටුව' ස්ථාපිත කිරීම"** යන මැයෙන් ජනාධිපතිතුමා ඉදිරිපත් කළ 2022-09-23 දිනැති සංදේශය - (අමප අංක 22/1135/601/002 පිළිබඳව වූ 2022-08-08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අදාළව) ඉහත සඳහන් සංදේශය වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා ඇමතිතුමාගේ නිරීක්ෂණ සහ එකී නිරීක්ෂණ සම්බන්ධයෙන් එතුමා විසින් මෙම රැස්වීමේදී සිදු කරන ලද වැඩිදුර පැහැදිලි කිරීම් සමඟ සලකා බලන ලදී. මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව, පහත සඳහන් පරිදි අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී:

(i) අමප අංක 22/1135/601/002 පිළිබඳව වූ 2022-08-08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ස්ථාපිත කරන ලද "ජීවන වියදම පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව" සහ "ආහාර සුරක්ෂිතතා කමිටුව" වෙනුවට "ආහාර ප්‍රතිපත්ති කමිටුව" පිහිටුවීම සඳහා;

(ii) සංදේශයේ අවසන් පූර්ව ඡේදයෙහි සඳහන් (ආ), (ඇ) සහ (ඉ) යෝජනා සඳහා; සහ

(iii) පහත සඳහන් අමාත්‍යාංශ ලේකම්වරුන් ද ඉහත සඳහන් ආහාර ප්‍රතිපත්ති කමිටුවේ සාමාජිකයින් වශයෙන් පත් කිරීමට යටත්ව, සංදේශයේ අවසන් පූර්ව ඡේදයෙහි සඳහන් (ඇ) යෝජනාව සඳහා:

* ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය;
* ලේකම්, ධීවර අමාත්‍යාංශය;
* ලේකම්, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය;
* ලේකම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය; සහ
* ලේකම්, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය.

→3

තවද, මෙම තීරණය සම්මත කරනු ලැබූ සේ සැලකීමටත්, ඒ අනුව අවශ්‍ය කටයුතු සඳහා අදාළ බලධාරීන් වෙත මෙම තීරණය දන්වා යැවීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ ලේකම්ට බලය පැවරීමටත් තීරණය කරන ලදී.

ක්‍රියා කළ යුතු: **ජනාධිපති ලේකම්** - ඉහත නිරීක්ෂණ යා කොට ඇත.

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.

සිවිල අමාත්‍යාංශය - ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කිරීම පිණිස - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.

කෘෂිකර්ම අමාත්‍යාංශය - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.

වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය

ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.

ආහාර කොමිසාරිස් - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.

සමුපකාර සංවර්ධන කොමිසාරිස් - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.

අධ්‍යක්ෂ ජනරාල්, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.

→ 4

ප්‍රධාන විධායක නිලධාරි, සීමාසහිත ලංකා සත්තෙස සමාගම - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.

සාමාන්‍යාධිකාරි, වී අලෙවි මණ්ඩලය - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.

පිටපත්: **අග්‍රාමාත්‍ය ලේකම්** - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.

අමාත්‍ය මණ්ඩලයේ අනෙකුත් සියලුම අමාත්‍යාංශ - ගරු ඇමතිතුමාගේ/ගරු රාජ්‍ය ඇමතිතුමාගේ/ගරු රාජ්‍ය ඇමතිතුමියගේ අවධානයට යොමු කිරීම පිණිස - සංදේශයේ පිටපතක් හා ඉහත නිරීක්ෂණ යා කොට ඇත.

For Office Use

06. Cabinet Paper No.22/1495/601/014, a Memorandum dated 2022-09-23 by the President on "**Establishment of the 'Food Policy Committee'**" - (Cabinet decision dated 2022-08-08 on CP No.22/1135/601/002 refers) the above Memorandum was considered along with the observations of the Minister of Trade, Commerce and Food Security and the further clarifications made thereon by the Minister at this meeting. After discussion, it was decided to grant approval -

(i) to establish the "Food Policy Committee" instead of the "Cabinet Sub-Committee on Cost of Living" and the "Food Security Committee" established in terms of the Cabinet decision dated 2022-08-08 on CP No.22/1135/601/002;

For Office Use Only

(ii) to the proposals (b), (d) and (e) in the penultimate paragraph of the Memorandum; and

(iii) to the proposal (c) in the penultimate paragraph of the Memorandum, subject to appointing the following Secretaries to Ministries too as Members of the above Food Policy Committee:

* Secretary, Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government;
* Secretary, Ministry of Fisheries;
* Secretary, Ministry of Transport and Highways;
* Secretary, Ministry of Plantation Industries; and
* Secretary, Ministry of Power and Energy.

It was also decided to treat this decision as confirmed and to authorize the Secretary to the Cabinet of Ministers to convey the same to the relevant authorities for necessary action accordingly.

Contd.2/-

Action by: **Secretary to the President** - above observations annexed.
My/Finance, Economic Stabilization and National Policies - copy of Memorandum and above observations annexed.
My/Public Administration, Home Affairs, Provincial Councils and Local Government - copy of Memorandum and above observations annexed.
My/Fisheries - to be brought to the notice of the Hon. Minister - copy of Memorandum and above observations annexed.
My/Transport and Highways - copy of Memorandum and above observations annexed.
My/Agriculture - copy of Memorandum and above observations annexed.
My/Plantation Industries - copy of Memorandum and above observations annexed.
My/Power and Energy - copy of Memorandum and above observations annexed.
My/Trade, Commerce and Food Security
Governor of the Central Bank of Sri Lanka - copy of Memorandum and above observations annexed.
Food Commissioner - copy of Memorandum and above observations annexed.
Commissioner of Cooperative Development - copy of Memorandum and above observations annexed.
Director General, Consumer Affairs Authority - copy of Memorandum and above observations annexed.
Chief Executive Officer, Lanka Sathosa Limited - copy of Memorandum and above observations annexed.
General Manager, Paddy Marketing Board - copy of Memorandum and above observations annexed.

Copied to: **Secretary to the Prime Minister** - copy of Memorandum and above observations annexed.
All Other Cabinet Ministries - to be brought to the notice of the Hon. Minister/Hon. State Minister - copy of Memorandum and above observations annexed.

For Office Use

Checked by : 1.....
2 .....

ඇමුණුම 4

(12)

TIP/TP/01/10 (T 4) Vol 1

2022.04.25

ලේකම්
රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ

සීනි කිලෝ ග්‍රෑම් එකක් සඳහා පනවා තිබුණු විශේෂ වෙළඳ භාණ්ඩ බදු රු. 50 සිට ශත 25 දක්වා අඩුකිරීමෙන් බලාපොරොත්තු වූ සහනය පාරිභෝගික ජනතාවට ලැබීම පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා වූ විශේෂ විගණන වාර්තාව

ඉහත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් යොමුකර ඇති අංක රා.ගි.කා.ස. /9/2/2022 සහ 2022 මාර්තු මස 28 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව, විගණකාධිපතිවරයාගේ වාර්තාවේ ඇතුලත් නිර්දේශ (වාර්තාවේ අංක 07 යටතේ ඇති) සහ නිරීක්ෂණ (වාර්තාවේ අංක 06 යටතේ ඇති) සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කළ යුතු වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමුකිරීම් සඳහා මේ සමඟ ඉදිරිපත් කරමි.

ආර්. එම්. පී. රත්නායක
වැඩබලන ලේකම්
මුදල් අමාත්‍යාංශය

2022.03.24 දින පවත්වන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබාදුන් නියෝග පරිදි, සීනි කිලෝ ග්‍රෑම් එකක් සඳහා පනවා තිබුණු විශේෂ වෙළඳ භාණ්ඩ බදු රු. 50 සිට ශත 25 දක්වා අඩුකිරීමෙන් බලාපොරොත්තු වූ සහනය පාරිභෝගික ජනතාවට ලැබීම පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා වූ විශේෂ විගණන වාර්තාව සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරණු ලබන වාර්තාව

ඉහත කරුණ සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ ලේකම් විසින් මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමුකර ඇති අංක රා.ගි.කා.ස. /9/2/2022 සහ 2022 මාර්තු මස 28 දිනැති ලිපිය හා බැඳේ.

ඒ අනුව, විගණකාධිපතිවරයාගේ වාර්තාවේ ඇතුලත් **නිර්දේශ** (වාර්ථාවේ අංක 07 යටතේ ඇති) සහ **නිරීක්ෂණ** (වාර්ථාවේ අංක 06 යටතේ ඇති) සම්බන්ධයෙන් වාර්ථාවක් මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමුකළ යුතුව ඇති බැවින්, ඒ සඳහා පහත කරුණු ඉදිරිපත් කර ඇත.

විගණන වාර්තාවේ නිර්දේශ - අංක (07)

අනු අංක	මුදල් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන කරුණු
7.1	මෙහිදී අදාළ බදු සහනය ඉදිරියේදී ජනතාව වෙත ලබාදීම ප්‍රායෝගිකව සිදුකළ නොහැකි බැවින්, ඒ සඳහා අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ඇති හැකියාව පිළිබඳව නීතිපති උපදෙස් ලබාගැනීමෙන් අනතුරුව රජය කැපකළ බදු ආදායම තම අත රඳවාගත් පාර්ශවයන්ගෙන් ලබාගැනීම සඳහා කටයුතු කිරීමට එකඟවෙමි. මේ සම්බන්ධයෙන්, (i) 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු අධිකාරී පනතේ 7 වන සහ 8 වන වගන්ති යටතේ කටයුතු කිරීම සහ (ii) ඉදිරියේදී මෙවැනි ආකාරයෙන් දේශීය වෙළඳාමේදී පාරිභෝගිකයාට ලැබිය යුතු සහනය ලබානොදෙන විට, ඒ සඳහා දේශීය ආදායම් පනත යටතේ අවශ්‍ය සංශෝධනයන් සිදුකර ගතහැකි ක්‍රියාමාර්ග සොයා බැලීම සුදුසු වේ.
7.2	මෙම කාලයේදී බදු සංශෝධනයන් සම්බන්ධ තීරණයන් ගැනීම ප්‍රධාන වශයෙන් සිදුකරන ලද්දේ,අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කළ, ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුත් Tariff Determination Committee මගිනි. කෙසේ වුවද, මෙම අවස්ථාවේදී අදාළ භාණ්ඩ 04 සඳහා බදු අඩුකිරීමට අදාල තීරණය ජනාධිපතිතුමාගේ උපදෙස් මත ගැනීමෙන් අනතුරුව, එය ක්‍රියාත්මක කිරීම සඳහා පසුව මුදල් අමාත්‍යාංශය දැනුවත් කිරීම ජනාධිපතිතුමාගේ ලේකම් විසින් 2020.10.13 දිනැති ලිපිය **(ඇමුණුම 3)**මගින් සිදුකර ඇත. ඒ අනුව අදාල තීරණය වහාම ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය මත මුදල් අමාත්‍යතුමාගේ ද එකඟතාවය අනුව අවශ්‍ය කටයුතු සිදුකර ඇත.
7.3	මේ සම්බන්ධයෙන් ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් ඉදිරිපත්කර ඇති අංක ICED/3/2020/2 සහ 2022.04.07 දිනැති ලිපියේ **(ඇමුණුම 5)** කරුණු ඉදිරිපත් කර ඇත.
7.4	පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් අදාල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම අපේක්ෂා කෙරේ.

1

7.5	පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් අදාල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම අපේක්ෂා කෙරේ.
7.6	පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් මේ සම්බන්ධයෙන් දැනට කරනු ලබන කාර්යයන් අනුව අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සුදුසු වේ.
7.7	වෙළඳ අමාත්‍යාංශය සහ ලංකා සතොස ආයතනය විසින් අදාල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම අපේක්ෂා කෙරේ.
7.8	පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් අදාල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම අපේක්ෂා කෙරේ.
7.9	පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් මේ සම්බන්ධයෙන් දැනට කරනු ලබන කාර්යයන් අනුව අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සුදුසු වේ.
7.10	බදු පැනවීමේදී මේ සම්බන්ධයෙන් දැනටමත් කටයුතු කරන අතර, පාලන මිල සහ මිල නියාමනය සම්බන්ධයෙන් පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් මේ සම්බන්ධයෙන් දැනට කරනු ලබන කාර්යයන් අනුව අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සුදුසු වේ.
7.11	මේ සම්බන්ධයෙන් ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් ඉදිරිපත්කර ඇති අංක ICED/3/2020/2 සහ 2022.04.07 දිනැති ලිපියේ **(ඇමුණුම 5)** කරුණු ඉදිරිපත් කර ඇත.
7.12	දේශීය දුඹුරු සීනි නිෂ්පාදනය සඳහා වැයවන පිරිවැය පිළිබඳව ද අවධානය යොමුකර අදාල අමාත්‍යාංශයේ එකඟතාව මත, ඒ සඳහා පාලන මිලක් පැනවීම දේශීය සීනි නිෂ්පාදන කර්මාන්තයේ ඉදිරි සංවර්ධනය සඳහා බාධාවක් වියහැකිද යන්න අධ්‍යනය කළ යුතුය.

විගණන වාර්තාවේ නිරීක්ෂණ - අංක (06)

විගණන වාර්තාවේ නිරීක්ෂණ අනු අංක	**මුදල් අමාත්‍යාංශයේ නිරීක්ෂණ**
6.1	මෙම කාලපරිච්ඡේදයේදී පැවති කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ ජනතාව වෙත හැකි අයුරින් සහනයන් ලබාදීමේ රාජ්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට රජයේ අවධානය යොමු කර තිබුණි. විශේෂයෙන් නිරෝධායන කටයුතු නිසා රැකියා අවස්ථා අහිමිවීම් සැලකිල්ලට ගෙන ජනතාව වෙත සෘජුව මූල්‍ය අධාර කිරීමට (රු.5000ක දීමනාවක් ලබාදීම) පවා රජය මැදිහත් විය. එවැනි වාතාවරණයක් තුළ, අතිගරු ජනාධිපතිතුමාගේ නීරණයක් පරිදි, ජනතාවට අත්‍යාවශ්‍ය භාණ්ඩ 04 ක පමණ (සීනි, පරිප්පු, ලොකු එනු සහ ටින් මාළු) බදු අඩුකිරීම සිදුකර ඇත. මෙසේ සීනි සඳහා 2020.10.14 දින සිට ක්‍රියාත්මක සහනදායී ශත 25 ක් වූ බද්ද මේ වන විටත් ක්‍රියාත්මක වන අතර, ඒ අනුව 2020.10.14 සිට 2022.03.31 දින දක්වා (මාස 17.5 ක් තුළ) සීනි මෙ. ටොන් 857,571 ක් ආනයනය කර ඇති අතර, එම ප්‍රමාණය සාමාන්‍ය මාසික අවශ්‍යතාවය වන මෙ. ටොන් 48,926 ක ප්‍රමාණය හා සැසඳීමේදී අසාමාන්‍ය ලෙස සීනී ආනයනය වීමක් මේ වන විට වාර්ථා නොකරයි.

	එමෙන්ම 2008 වර්ෂයේ සිට මේ දක්වා රජයේ ප්‍රතිපත්තීමය කරුණු මත ආනයනික සීනි සඳහා අදාළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වරින් වර සංශෝධනය කිරීම සිදුකර ඇත **(ඇමුණුම 1).**
6.2	2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ ඕනෑම ආනයනකරුවකුට පොදුවේ අදාළ වන පරිදි, (General Duty) 2020 ඔක්තෝබර් මස 13 දිනැති අංක 2197/12 දරන ගැසට් නිවේදනය මගින් සීනි, පරිප්පු, බොම්බයි ළුණු සහ විත්මාළු සඳහා ගත 25 ක බද්දක් ක්‍රියාත්මක කරන ලදී. එය තෝරාගත් ආනයනකරුවකු වෙත පමණක් බදු සහනයක් ලබාදීමට නිකුත්කළ නියෝගයක් නොවේ. තවද, මෙම නියෝගය මගින් එක් ආනයනකරුවකුට ආනයනය කළ හැකි (Quota Restrictions) ප්‍රමාණයක් / සීමා කිරීමක් දක්වා නොමැත. මෙම පනත යටතේ තෝරාගත් ආයතනයකට පමණක් බදු වාසියක් ගෙන දීමට අවශ්‍ය නම්, එකී පනතේ 5 වන වගන්තිය යටතේ බදු සහනයක් (Duty Waiver) ලබාදීමට ඇති විධිවිධාන භාවිතයට ගත හැකිව තිබුණි. මෙම අවස්ථාවේදී පැවති සීනි මිල ඉහළයාම පාලනය කිරීමට ගතහැකි ක්‍රියාමාර්ගය වූයේ වෙළඳපලේ සීනි සැපයුම වැඩිකිරීමට කටයුතු කිරීමයි. මෙහිදී සීනි ආනයනයට රජයේ මැදිහත්වීමක් නොමැති පසුබිමක, පෞද්ගලික අංශයේ සීනි ආනයනකරුවන් ඒ ඒ ආනයනකරුවන්ගේ හැකියාව මත සීනි තොග ආනයනය කර ඇති අතර, ඒ අනුව ඔවුන් ලබා ඇති බදු වාසිය ප්‍රමාණාත්මක විචලනයන්ට ලක්වීම සිදුවී ඇත.
6.3	මේ අවස්ථාවේ සීනි මිල අඩුකිරීමට හෝ සීමා ලෙස ඉහළයාම පාලනයට සීනි සැපයුම වැඩිකළ යුතු බැවින්, මෙම බදු අඩුකිරීමේ තීරණය සුදු සහ දුඹුරු යන දෙවර්ගයේම සීනි සඳහා වූ රේගු සංකේතාංක වලට අදාළ කරන ලදී.
6.4	ඉහත අංක 6.1 සහ 6.3 හි පිළිතුර අදාළ වේ.
6.5	සීනි ආනයනකරුවන් සීමිත සංඛ්‍යාවක් මෙම ව්‍යාපාර අංශයේ යෙදෙන බව වගු අංක 17 මගින්ද නහවුරු වේ. එම 17 වගුව අනුව ප්‍රධාන ආනයනකරුවන් 09 දෙනෙකු එම කාලයට අදාළ සීනි ආනයනයෙන් 88% ක් පමණ ආවරණය කර ඇත. එබැවින් සමාගම් කීපයක් සඳහා විශේෂ කොට බදු සහනයක් ලබාදී නොමැත. (i) වගු අංක 05 හි තොරතුරු අනුව 2020 ඔක්තෝබර් මාසයට සාපේක්ෂකව 2020 නොවැම්බර් සහ දෙසැම්බර් මාස වනවිට වෙළඳපල මිලෙහි යම් අඩුවීමක් (අවම වශයෙන් රු.10 සහ 18 ත් අතර පරාසයක හෝ) වාර්ථා කරයි. නමුත් එය රු.49.75 ක් විය යුතුයැයි ගණන් බැලීම ප්‍රායෝගික නොවන්නේ ඒ වන විටත් වෙළඳපලේ රු.50ක් වූ ඉහළ බද්දක් ගෙවූ සීනි තොග වෙළඳපළ තුළ ව්‍යාප්ත වී ඇති පසුබිමකය. (ii) එමෙන්ම මෙම විගණන වාර්ථාවේම, වගු අංක 10 සහ 11 මගින් වාර්ථා කර ඇති පරිදි ජාත්‍යන්තර වෙළඳපලේ සීනි මිල 2020 ඔක්තෝබර් වන විට ඇ.ඩො.395 සිට 2021 පෙබරවාරි වන විට ඇ.ඩො. 460.41 ක් දක්වා වැඩිවී ඇති බැවින් මෙම බදු අඩුකිරීම තුළින් පාරිභෝගිකයාට ලැබිය යුතු බදු වාසිය රු.49.75 ක් ම විය යුතුයැයි ගණනය කිරීම නිවැරදි නොවේ.
6.6	මෙම කාලයේදී බදු සංශෝධනයන් සම්බන්ධ තීරණයන් ගැනීම ප්‍රධාන වශයෙන් සිදුකරන ලද්දේ ජනාධිපති ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුත් Tariff Determination

	Committee මගිනි. තවද, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව මගින් බදු සංශෝධනයන් සිදු කරන ක්‍රමවේදයන් 2021.03.21 දිනයෙන් විගණනය සඳහා යොමුකර ඇත **(ඇමුණුම 2)**. ඒ අනුව, මෙම බදු සංශෝධනය අනිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි ජනාධිපතිතුමාගේ ලේකම් විසින් 2020.10.13 දින සවස 4.57 ට පමණ Fax පණිවුඩයක් මගින් එදින මධ්‍යම රාත්‍රියේ සිට ක්‍රියාත්මක කිරීමට දී ඇති උපදෙස් අනුව කටයුතු කරමින් **(ඇමුණුම 3)** අදාළ තීරණය ක්‍රියාත්මක කිරීම මුදල් අමාත්‍යාංශය විසින් සිදු කර ඇත. එමෙන්ම ඒ ඒ රාජ්‍ය ආයතන වලට වෙන්වූ කාර්යභාරයන් පැවරී ඇති බැවින් එම වගකීම් පොදුවේ දැරියයුතු යැයි යන්න පිළිගත නොහැක. එනම්, මෙහිදී බදු සංශෝධන නියෝගය නිකුත්කිරීමේ වගකීම මුදල් අමාත්‍යාංශය මගින් ඉටුකළ යුතුවීම සහ පාරිභෝගික කටයුතු අධිකාරියේ කාර්යයන් ඊට වෙනස් ස්වරූපයන් ගන්නා බවත් පෙන්වා දිය හැක.
6.7 සහ 6.8	වෙළඳපල මිල පහළ දැමීම සඳහා සීනි සැපයුම් වැඩි කිරීමේ න්‍යායාත්මක කරුණ මෙයින් සනාථ වේ. බදු අඩුකිරීමෙන් අපේක්ෂා කළ ප්‍රතිඵලයක් අනුව මෙම ප්‍රමාණාත්මක වෙනස සිදුවීම සැලකිල්ලට ගත යුතු අතර, මෙම බදු සංශෝධනය 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ නියමය පරිදි, එකී නියෝගයේ වලංගු කාලය මාස 03 කට සීමාකර පැනවීම නිසා සීනි ආනයනකරුවන් සහනදායී බද්දක් යටතේ වැඩිපුර සීනි තොග කඩිනමින් ආනයනයට පෙළඹීම සාමාන්‍ය ව්‍යාපාරික හැසිරීම වේ. එසේ වූවද, ශත 25 ක්වූ සහනදායී බද්ද යටතේ 2020.10.14 සිට 2022.03.31 දක්වා කාලය තුළදී මෙරටට ආනයනය කර ඇති මුළු සීනි ප්‍රමාණය මෙ. ටොන් 857,571 වන අතර, එම සීනි ප්‍රමාණය ආනයනයට අදාළ මුළු කාලසීමාව වන මාස 17.5 කාලය ගත්විට, එය මාසික පාරිභෝජන අවශ්‍යතාවය (මෙ.ටොන් 48,926 ට ආසන්න අගයකි **(ඇමුණුම 4)**
6.9	2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ ඕනෑම ආනයනකරුවකුට පොදුවේ අදාළ වන පරිදි, (General Duty) 2020 ඔක්තෝබර් මස 13 දිනැති අංක 2197/12 දරන ගැසට් නිවේදනය මගින් සීනි සඳහා සහනදායී බද්දක් පැනවීම සිදුකරන ලදී. ඒ ඒ ව්‍යාපාරික මූල්‍ය ශක්තිය සහ තොග රඳවා ගැනීමට ඇති හැකියාව අනුව, අඩුබද්දක් පවතින විට වැඩි සීනි ප්‍රමාණයක් ආනයන කිරීම අපේක්ෂා කළ හැකි තත්ත්වයකි.
6.10	රේගු ආඥා පනතයටතේ පවතින නීතිරීති වලට යටත්ව වෙළඳාම පහසුකරලීම සඳහා (Trade Facilitation) ලබාදී ඇති පහසුකමකි බන්ධිත ගුදම් පහසුකම්. ඒ අනුව සීනි සඳහා බන්ධිත ගුදම් පහසුකම ව්‍යාපාරික ආයතන 02 ක් විසින් ලබාගෙන ඇත (වගුව 15). මෙම බන්ධිත ගුදම් පහසුකම යටතේ ආනයනකරුවකුට විශාල තොගයක් එකවර රැගෙන විත් ප්‍රවාහන පිරිවැයේ වැනි වාසි ලබාගැනීමටත් , එය ගුදමින් ඉවත්කර ගන්නා අවස්ථාවේ පවතින බද්ද ගෙවීමට ද යටත් වේ. ඒ අනුව මෙම

	ආයතනය බදු අඩුකල විගස ව්‍යාපාරික වාසි සලකා අදාළ සීනි නොගය නිදහස් කරගෙන ඇත.
6.11	මෙම අවස්ථාවේදී අදාළ භාණ්ඩ 04 සඳහා බදු අඩුකිරීමට අදාල තීරණය ගැනීමෙන් පසුව ජනාධිපතිතුමාගේ ලේකම් විසින් මුදල් අමාත්‍යාංශය දැනුවත් කරන ලදී. ඒ අනුව අදාල තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කර ඇති අතර, මෙම බදු සංශෝධනය ජනාධිපතිතුමාගේ ලේකම් විසින් 2020. 10.13 දින සවස 4.57 ට පමණ fax පණිවුඩයක් මගින් එදින මධ්‍යම රාත්‍රියේ සිට ක්‍රියාත්මක කිරීමට දී ඇති උපදෙස් අනුව කටයුතු කර ඇත **(ඇමුණුම 3).** බදු සංශෝධනයන් සිදු කරන ක්‍රමවේදයන් 2021.03.21 දිනයෙන් විගණය සඳහා යොමුකර ඇත **(ඇමුණුම 2).**
6.12	ඉහත 6.11 පිලිතුර හා බැඳේ. තවද, බදු සංශෝධනයක් ක්‍රියාත්මක කිරීමට පෙර ආනයනකරුවන් සමඟ එකඟතාවයන්ට එළඹීමක් සිදුනොවන අතර, එම අභ්‍යන්තර තොරතුරු බදු සංශෝධනයකට පෙර ආනයනකරුවන් වෙත පත්වීමෙන්ද අයුතුලාභ ලබාගැනීමට අවස්ථා ඇතිවිය හැක. එසේ වූවද, ඒ ඒ කර්මාන්ත වල ඉදිරිපත් වන ගැටළුකාරී තත්ත්වයන් (අයවැය යෝජනා වැනි) සම්බන්ධයෙන් අවශ්‍ය අවස්ථා වලදී සාකච්ඡා කර ඉහළ අනුමැතියට යොමු කරනු ලැබේ.
6.13 6.14 6.15 6.16 (වාර්ථාවේ නැවත 6.15 ලෙස ඇත) 6.18 සහ 6.19	පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මගින් මෙම නිරීක්ෂණ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළ යුතුව තිබේ.
6.17 6.20 6.21 සහ 6.22	මේ සම්බන්ධයෙන් ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් ඉදිරිපත්කර ඇති අංක ICED/3/2020/2 සහ 2022.04.07 දිනැති ලිපිය **(ඇමුණුම 5)** මගින් ඉදිරිපත් කර ඇත.
6.23 6.24 සහ 6.25	වෙළඳ අමාත්‍යාංශය සහ ලංකා සනොස ආයතනය මගින් මෙම නිරීක්ෂණ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළ යුතුව තිබේ.
6.26 6.27 සහ 6.28	විගණන වාර්තාවේ නිරීක්ෂණ හා එකඟයි

5

(18) C

ANNEXTURE - 1

Year	SCL Duty Rate (Rs /per Kg)		Effective Date	Gazette No & Date
	White Sugar	Brown / Raw Sugar		
2008	14	Not applied SCL Duty	09.01.2008	1531/13 -09.01.2008
	16	Not applied SCL Duty	07.11.2008	1574/11 -06.11.2008
2009	6	6	10.11.2009	1627/9 -09.11.2009
	1	1	21.12.2009	1632/37 - 20.12.2009
2010	10	10	18.06.2010	1658/31 – 17.06.2010
2011	10	10	Duty not Change	
2012	15	15	13.01.2012	1740/20 -12.01.2012
	20	20	20.06.2012	1763/11 -19.06.2012
2013	27	27	01.08.2013	1821/32 - 31.07.2013
	30	30	22.11.2013	1837/26 -21.11.2013
2014	25	25	22.05.2014	1863/13-21.05.2014
	28	28	16.07.2014	1871/23 -15.07.2014
	33	33	05.09.2014	1878/42- 2014.09.04
	28	28	02.12.2014	1891/8 -014.12.02 -
2015	18	18	30.01.2015	1899/32 – 29.01.2015
	30	30	08.09.2015	1931/7 -07.09.2015
2016	.25 cents	.25 cents	19.07.2016	1976/4 – 18.07.2016
	2	15	16.09.2016	1984/26 -15.09.2016
	7	15	11.11.2016	1992/27 -10.11.2016
	13	15	20.12.2016	1998/5 -20.12.2016
2017	23	25	06.06.2017	2022/7 – 06.06.2017
	31	33	16.08.2017	2032/11 -15.08.2017
2018	Remove SCL and Impose Excise Duty Rs.30 per Kg and CID/ PAL/NBT		18.09.2018	2089/19 -17.09.2018
	33			
	32	35	02.11.2018	2095/21 -01.11.2018
2020	50	50	22.05.2020	2176/18-21.05.2020
	.25 cents	.25 cents (Normal Duty Structure applied on 12.01.2022)	14.10.2020	2197/12 – 13.10.2020

ANNEXTURE 2

බද්දක් තීරණය කිරීමේදී සිදුකරනු ලබන කාර්යභාරය හා ක්‍රියාපිළිවෙත

1. අවශ්‍යතාව හඳුනාගැනීම සහ ඉදිරිපත් කිරීම

	අවශ්‍යතාව හඳුනාගන්නා පාර්ශව	ඉදිරිපත් කිරීමේ ස්වභාවය
i.	ජනාධිපතිතුමා/ මුදල් ඇමතිතුමා හෝ අමාත්‍ය මණ්ඩලය විසින් ලබාදෙන විධානයන් අනුව	ගැසට් නුය සකස්කර ඇමතිතුමා වෙත අනුමැතිට සහ අත්සනට සටහනකින් ඉදිරිපත්කරයි.
ii.	අමාත්‍යාංශයක් හෝ රාජ්‍ය ආයතනයක් හෝ රජය විසින් පත්කළ කමිටුවක් විසින් කරනු ලබන නිර්දේශ	නීරික්ෂණ සහිත සටහනක් මගින් බදු සංශෝධනය සිදු කිරීමට ගැසට් පනුය සකස්කර ඇමතිතුමා වෙත අනුමැතියට සහ අත්සනට සටහනකින් ඉදිරිපත් කරයි
iii.	ආනයනකරුවන් හෝ අගනියට පත් පාර්ශව කරුවන්ගේ ඉල්ලීම්	වෙළඳපල මිල/ ආනයන මිල ආදී දත්ත විශ්ලේෂණය කර බදු අනුපාත සංශෝධනය කළ හැකි / නොහැකි බව මුදල් ලේකම් වෙත සටහනක් ඉදිරිපත් කර ලබන අනුමැතිය මත බදු සංශෝධනය සිදු කිරීම.
iv.	ජාත්‍යන්තර වෙළඳපල මිල උච්චාවචනයන් සහ දේශීය වෙළඳපල මිල වෙනස්වීම් මත ඇතිවන අවශ්‍යතාවයන්/ රටේ පවතින හදිසි අවස්ථාවක් මත ඇතිවන අවශ්‍යතා අනුව	වෙළඳපල මිල/ ආනයන මිල ආදී දත්ත විශ්ලේෂණය කර බදු අනුපාත සංශෝධනය කළ හැකි / නොහැකි බව මුදල් ලේකම් වෙත සටහනක් ඉදිරිපත් කර ලැබෙන අනුමැතිය මත ඇමතිතුමා වෙත අනුමැතියට සහ අත්සනට සටහනකින් ඉදිරිපත් කර බදු සංශෝධනය සිදු කිරීම.

2. තීරණය කිරීම

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත	පනතේ 2 වන සහ 5 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින්
1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත	පනතේ 2 වන වගන්තිය යටතේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව අමාත්‍යවරයා විසින්

3. තීරණය ක්‍රියාත්මක කිරීම

i. මුදල් අමාත්‍යවරයාට නියෝගයන් නිකුත් කිරීමට අවශ්‍ය ගැසට් නිවේදනයන් පිළියෙළ කර අනුමැතියට ය්ටත්ව අත්සනට ඉදිරිපත් කිරීම.

ii. ගැසට් අංකයක් වෙන්කරවාගෙන මුද්‍රණය කිරීම

iii. ක්‍රියාත්මක කිරීමට රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත යැවීම

iv. වෙබ් පිටුවේ පළ කිරීම

4. අමාත්‍ය මණ්ඩල අනුමැතිය, රාජ්‍ය මුදල් කමිටුවේ අනුමැතිය සහ පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම

ANNEXTURE 3

ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

13th October 2020

Mr. S. R. Attygalle
Secretary
Ministry of Finance
Colombo 01

Relief to the Cost of Living

His Excellency the President has instructed to remove the prevailing Special Commodity Levy / applicable custom based taxes on lentil (Rs.10/Kg), canned fish(Rs. 50/425g can), Big onion (Rs. 50/Kg) and Sugar (Rs.50/Kg) with effect from midnight today.

Please issue necessary instructions to Director General of Customs after obtaining concurrence from Hon. Prime Minister / Minister of Finance.

P.B. Jayasundera
Secretary to the President

Copy : i. Hon. Basil Rajapaksa – Chairman of the PresidentialTask for Economic Revival and Poverty Alleviation

ii. Mrs. J. M. Bhadrani Jayawardena - Secretary, Ministry of Trade - to brief the Hon. Minister

iii. Mr. Nushad Perera – Chairman, Sathosa – to make price adjustments to reflect the tax reduction and also to sell lentil at of Rs.150/Kg for those who purchase food baskets of canned fish, big onions and sugar in excess of Rs. 5K/-

++ 94 (0) 11 2354418
++ 94 (0) 11 2473873
++ 94 11 2446651
prseo@presidentsoffice.lk

18 G

Annexure - 4

Importation of Sugr

Average annual imported quantity of sugar, Averagemonthly usage of Sugar during the period of 2016 to 2021 is (MTs) as follows.

Year	Import Quantity per Year	Average Import Quantity per Month
2016	644,813	53,734
2017	476,767	39,730
2018	633,006	52,750
2019	532,297	44,358
2020	669,865	55,822
2021	566,013	47,168
Average (6 years)	**587, 126**	**48,927**

